# දහම් පාසල් අවසාන විභාගය

# බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය පසු ගිය ප්‍රශ්න

# [01] පාඩම පටිච්ච සමුප්පාදය

## [2024/2025] [01] ප්‍රශ්නය

I පටිච්ච සමුප්පාද ඉගැන්වීම මුලින්ම ශ්‍රවණය කළ බුද්ධ ශ්‍රාවකයන් දෙදෙනා නම් කරන්න.
II පටිච්ච සමුප්පාදයෙන් ප්‍රතික්ෂේප වන බුද්ධ කාලීන භාරතයේ පැවති මතවාද හතරක් ලියන්න.
III [අ] පටිච්ච සමුප්පාද න්‍යාය සංක්ෂිප්තව දක්වන වගන්ති හතරකින් යුත් පාඨය ලියා දක්වන්න.
[ආ] එම කෙටි සූත්‍රය පිළිබඳව හැඳින්වීමක් කරන්න.
IV ද්වාදසාංගික පටිච්ච සමුප්පාදය නම් කොට එහි ධර්මාර්ථ පැහැදිළි කරන්න.

## [2020/2021/2022/2023]

## [01] වන ප්‍රශ්නය

I යම්කිසි හේතුවක් නිසා තවත් ධර්මයන් ඇතිවීම පිළිබඳව දේශනා කළ මූළික ඉගැන්වීම නම් කරන්න.
II [අ] ඉහත එකෙහි දැක්වෙන මූළික ඉගැන්වීමට අයත් ක්‍රමවේද හතර ලියා දක්වන්න.
[ආ] ඉහත දෙකෙහි [අ] හි සඳහන් ක්‍රමවේද හතර කෙටියෙන් හඳුන්වන්න.
III [අ] මිනිසා ජරා මරණයන්ට ගොදුරු වන්නේ කුමක් හෙයින්ද යන ප්‍රශ්නය බෝසත්තුමා තුළ පහළ වූයේ කවර අවධියක,කුමන අවස්ථාවක දැයි පෙන්වා දෙන්න.
[ආ] සත්ත්වයා සසර සැරිසැරීමට,අවුලෙන් අවුලට පත්වීමට හේතුව පැහැදිළි කෙරෙන දීඝ නිකායේ ඇතුළත් සූත්‍රයේ නම ලියන්න.
IV සමාජගත ගැටළු විසඳා ගැනීම සඳහා එකෙහි සඳහන් ධර්මතාව උපකාරී වන අයුරු පෙන්වා දෙන්න.

## [[2019/2020]]

## [ 01] වන ප්‍රශ්නය

I සත්ත්වයාගේ උපත හා මරණය පිළිබඳව බුද්ධ කාල භාරතයේ පැවති මතවාද දෙකක් නම් කරන්න.
II ඉහත නම් කරන ලද මතවාද දෙක විස්තර කරන්න.
III [අ] එවැනි මතවාදවල ඇති අන්තගාමී ලක්ෂණ පැහැදිළි කරමින් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ හේතුඵලවාදය හැඳින්වෙන නම ලියන්න.
[ආ] එකී මතවාදය ඉදිරිපත් කරන සූත්‍රය ලියා දක්වන්න.
IV "ගැටළුවක් විවරණය කිරීම පමණක් නොව විසඳුමක් ඉදිරිපත් කිරීමද බුදු දහමෙහි අරමුණ වේ". හේතුඵල ධර්මය ඇසුරින් පහදන්න.

*විල්වල ස්කෝලේ හාමුදුරුවෝ.*

## [[ 2018/2019 ]]

## [01] වන ප්‍රශ්නය

I හේතුඵල සිද්ධාන්තය මුල් කර ගනිමින් ප්‍රථමයෙන් ධර්මය දේශනා කළ රහතන් වහන්සේ හා එම ධර්මය අවබෝධ කරගත්තේ කවුරුන්දැ'යි දක්වන්න.

II ඉහත එකෙහි සිදුවීමට අදාළ තොරතුරු සඳහන් වන විනය ග්‍රන්ථයත්, එම ධර්මය නොදැනීම නිසා සසර සැරිසැරීමට හේතුව දැක්වෙන දීඝ නිකායගත සූත්‍රයත් නම් කරන්න.

III හේතුඵල ධර්මතාවය ලොව සඳහටම පවත්නා සත්‍ය බව දේශනා කිරීමට හේතුවූ කරුණු කෙටියෙන් ඉදිරිපත් කරන්න.

IV සත්ත්වයා සසර සැරිසැරීමට හෙවත් පුනර්භවයක් ලැබීමට හේතුව ප්‍රතීත්‍ය සමුප්පන්න විග්‍රහය මඟින් පෙන්වා දෙන්න.

## [[ 2017/2018 ]]

## [01] වන ප්‍රශ්නය

I බුදු රජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කළ ස්ථානය හා සතිය දක්වන්න.

II එම ධර්මය මෙනෙහි කළ ක්‍රමය කී වැදෑරුම් දැයි දක්වා, ඒවා නම් වශයෙන් හඳුන්වන්න.

III එම ක්‍රමවලින් ප්‍රකාශිත සසර ගමනේ ස්වභාවය පෙන්වාදී පටිච්ච සමුප්පාදය ඉදිරිපත් කරන කෙටි සූත්‍රය පෙන්වා දෙන්න.

IV පටිච්ච සමුප්පාද ධර්මයට අයත් අංග දොළහ ලියා අවිද්‍යාව නිසා රැස් කරන කර්ම කවරේදැයි පෙන්වා දෙන්න.

## [[ 2015/2016 ]]

## [01] වන ප්‍රශ්නය

I හේතුඵල සිද්ධාන්තය මුල් කරගනිමින් ප්‍රථමයෙන් ධර්මය ඇසූ පිරිවැජියන් දෙදෙනා නම් කරන්න.

II අවිද්‍යාව නිසා රැස් කරන කර්ම ප්‍රභේද 02ක් දක්වා, වේදනාව මුල් කරගෙන උපදින ප්‍රත්‍ය ධර්මය නම් කරන්න.

III ශාස්වත වාදයේ හා උච්ඡේද වාදයෙහි වෙනස දක්වා, මේ දෙකට අයත් නොවන වෙනත් වාද දෙකක් දක්වන්න.

IV හේතුඵල වාදයට අනුකූලව දෙවැදෑරුම් දුක දක්වා, පටිච්ච සමුප්පාදය අවබෝධ කර ගැනීමේ ප්‍රධාන පරමාර්ථය කෙටියෙන් පහදන්න.

## [[ 2014/2015 ]]

## 04 වන ප්‍රශ්නය

I පටිච්ච සමුප්පාදය හඳුන්වන සමාන වචනයක් ඉදිරිපත් කරන්න.

II පටිච්ච සමුප්පාද න්‍යායෙන් ප්‍රතික්ෂේප වන වාද හතරක් නම් කරන්න.

III පටිච්ච සමුප්පාද ධර්මය ඉදිරිපත් කරන කෙටි සූත්‍ර න්‍යාය ලියා උදාහරණයක් සමග එය සසඳන්න.

IV හේතුව නැති කිරීමෙන් ඵලය ද නැතිවන ආකාරය පටිච්ච සමුප්පාද ධර්මයෙන් පෙන්වා දෙන්න.

*විල්වල ස්කෝලේ හාමුදුරුවෝ.*

## [[ 2013/2014 ]]

## [01] වන ප්‍රශ්නය

(අ) දුක ඇතිවීම නැවැත්වීම පිළිබඳව බුදුරදුන් දේශනා කරන ලද ධර්ම සංකල්පය නම් කරන්න.
(ආ) එයට අදාළ ප්‍රත්‍ය මාලාව සංඛ්‍යාත්මක වශයෙන් දක්වා, එය නම් වශයෙන් ලියන්න.
(ඉ) මේ එක් එක් ප්‍රත්‍යක් තවත් ප්‍රත්‍යකට සම්බන්ධවන පැවත්ම හඳුන්වා ඇත්තේ කවර නමකින් දැයි ලියා ඒ සඳහා දක්වා ඇති උපමාව පෙන්වා දෙන්න.
(ඊ) බෞද්ධ පරමාර්ථය පුනර්භවය නැති කිරීමයි.පහදන්න.

## [[ 2011/2012 ]]

## 01 වන ප්‍රශ්නය

(අ) අනුලෝම-පටිලෝම මනසිකාර ඇතුලත් ධර්ම සංකල්පයේ නම ලියා, මෙම වචන යුගළයේ අර්ථ ඉදිරිපත් කරන්න.
(ආ) එම ධර්ම සංකල්පයට අයත් ප්‍රත්‍ය මාලාව නම් වශයෙන් දක්වා එය චක්‍රාකාරව ඉදිරිපත් කිරීමට හේතුව දක්වන්න.
(ඉ) **"ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ඣති."**
**"ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති."** මෙම පාලි වාක්‍යවල අර්ථය සිංහලයෙන් ලියා, සරල නිදසුනක් මඟින් එම අර්ථය පහදන්න.
(ඊ) ගැටළු විසඳා ගැනීමේ මාර්ගයක් වශයෙන් මෙම දේශනය කෙසේ භාවිතයට ගත හැකි දැයි සාකච්ඡා කරන්න.

## 03 වන ප්‍රශ්නය

(අ) සත්ත්වයා හා ලෝකය ඇතිවීම පිළිබඳව බුද්ධ කාලයේ පැවති මතවාද දෙකක් නම් කරන්න.
(ආ) එම මතවාද දෙක හඳුන්වන්න.
(ඉ) බුදු දහම එම මතවාද ප්‍රතික්ෂේප කරන්නේ මන්දැ'යි පෙන්වා දෙන්න.
(ඊ) ශාස්වත වාදය හා උච්ඡේද වාදය ඉදිරිපත් කළ චින්තකයෝ කවරහු දැ'යි දක්වා එම වාදයන්ගේ ස්වභාවය පැහැදිළි කරන්න.

## [[ 2008/2009 ]]

## 04 වන ප්‍රශ්නය

(අ) පටිච්ච සමුප්පාදය සඳහා භාවිතා කරන තවත් නමක් ලියා, පටිච්ච සමුප්පාද යන්නෙහි අර්ථය දක්වන්න.

(ආ) එම ධර්මය (පටිච්ච සමුප්පාදය) ඉදිරිපත් කරන කෙටි සූත්‍රය ලියන්න.

(ඉ) පටිච්ච සමුප්පාද ධර්මයට අයත් ප්‍රත්‍ය මාලාව දක්වා එය ගමන් ගන්නා ආකාරය කෙසේ දැයි පෙන්වා දෙන්න.

*විල්වල ස්කෝලේ හාමුදුරුවෝ.*

## [[ 2007/2008 ]]

## 01 වන ප්‍රශ්නය

(අ) යම්කිසි හේතුවක් නිසා තවත් ධර්මයක් ඇතිවීම පිළිබඳව දේශනා කළ මූළික ඉගැන්වීම නම් කරන්න.

(ආ) එම මූළික ඉගැන්වීමට අයත් මූළික ක්‍රමවේද හතර දක්වා, ඒවා හඳුන්වන්න.

(ඉ) සත්ත්වයාගේ හා ලෝකයේ ඇතිවීම පිළිබඳව බුද්ධ කාලයේ පැවති මිථ්‍යා මත තුනක් දක්වා, එම මත කෙටියෙන් විස්තර කරන්න.

(ඊ) මිනිසා ජරා මරණයන්ට ගොදුරු වන්නේ කුමක් හෙයින්ද යන ප්‍රශ්නය බෝසත්තුමා තුළ පහළ වූයේ කවර අවස්ථාවකදී දැයි ලියා ශාස්වත වාදය හා උච්ඡේද වාදය අතර වෙනස පහදන්න.

## [[ 2006/2007 ]]

## 04 වන ප්‍රශ්නය

(අ) හේතු ප්‍රත්‍ය ධර්ම මාලාවේ ප්‍රධාන අංග දොළහ නම් කරන්න.

(ආ) එම ප්‍රත්‍ය ධර්ම මාලාව කාලත්‍රයට බෙදා දක්වන්න.

(ඉ) පටිච්ච සමුප්පාද න්‍යාය විස්තර කරන මුල් සූත්‍රය ලියා අධිච්ච සනුප්පණ්ණ වාදය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(ඊ) "බුදු දහමෙහි අරමුණ වන්නේ ගැටළුවක් විවරණය කිරීම පමණක් නොව විසඳුමක්ද ඉදිරිපත් කිරීමයි" හේතුඵල දහම ඇසුරින් මෙය පැහැදිලි කරන්න.

## [[ 2005 ]]

## 01 වන ප්‍රශ්නය

(අ) බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය මෙනෙහි කළ ස්ථානය හා සතිය දක්වන්න.

(ආ) එම ධර්මය මෙනෙහි කළ ක්‍රමය කී වැදෑරුම් ද? නම් වශයෙන් දක්වන්න.

(ඉ) එම ක්‍රමයන්ගෙන් ප්‍රකාශිත සසර ගමන් ස්වභාවය පෙන්වා දෙන්න.

(ඊ) පටිච්ච සමුප්පාද ධර්මය ගැන සඳහන් වන විනය ග්‍රන්ථයත් දීඝ නිකායගත සූත්‍රයත් දක්වා එම ධර්මය ප්‍රථමයෙන් ඇසූ අය පිළිබඳව විස්තරයක් කරන්න.

*විල්වල ස්කෝලේ හාමුදුරුවෝ.*

## [[ 2004 ]]

## 03 වන ප්‍රශ්නය

(අ) බුද්ධ කාලයේ දක්නට ලැබෙන ආත්මවාදී ඉගැන්වීම් දෙකක් නම් කරන්න.

(ආ) එම ඉගැන්වීම් හඳුන්වා දෙන්න.

(ඉ) බුදු දහමට අනුව ලොව සඳහටම පවත්නා ධර්මතාව කවරක් දැ'යි ලියා එහි අංග ගෙනහැර දක්වන්න.

(ඊ) සමාජගත ගැටළු විසඳා ගැනීමට එම ධර්මතාව උපකාරවන අයුරු පහදන්න.

## [[ 2003 ]]

## 01 වන ප්‍රශ්නය

(අ) පටිච්ච සමුප්පදයේ මූළික සිද්ධාන්තය නම් කරන්න.

(ආ) සත්ත්වයාගේ හා ලෝකයේ ඇතිවීම පිළිබඳව පැවති මූළික මතවාද අතුරින් දෙකක් නම් කරන්න.

(ඉ) බෞද්ධ හේතුඵලවාදය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

(ඊ) දුක පිළිබඳව යථාවබෝධය ලබා ගැනීමට පටිච්ච සමුප්පදය හේතුවන ආකාරය පෙනවා දෙන්න.

## [[ 2002 ]]

## 03 වන ප්‍රශ්නය

අ) නියතිවාදය විස්තර කරන්න.

ආ) "අස්මිං සති ඉදං හෝති" පැහැදිලි කරන්න.

ඉ) තෘෂ්ණාවේ ප්‍රභේද විතර කරන්න.

ඊ) හේතු-ප්‍රත්‍ය ධර්ම මාලාවෙහි ප්‍රධාන අංග දොළස නම් කරන්න.

## [[ 2001 ]]

## 04 වන ප්‍රශ්නය

අ) පුබ්බෙකත හේතුවාදය හඳුන්වන්න.

ආ) ශාස්වත-උච්ඡේද වාද පැහැදිලි කරන්න.

ඉ) " බුදු දහම ඒවා ප්‍රතික්ෂේප කරයි." පහදන්න.

ඊ) බෞද්ධ හේතුඵල ධර්මය පැහැදිලි කරන්න.

*විල්වල ස්කෝලේ හාමුදුරුවෝ.*

## [[ 2000 ]]

## 04 වන ප්‍රශ්නය

අ) පටිච්ච සමුප්පාදයේ මූලික සිද්ධාන්ත නම් කරන්න.

ආ) ප්‍රතීත්‍ය සමුප්පාදයේ ද්වාදසාංගය නම් කරන්න.

ඉ) “ යමෙක් පටිච්ච සමුප්පාදය දකීද, හෙතෙම ධර්මය දකී.”විමසන්න.

ඊ) බෞද්ධ හේතුඵල ධර්මය නූතන ඉගැන්වීම් සමඟ ගැළපේදැයි පරීක්ෂා කරන්න.

## [[ 1999 ]]

## 01 වන ප්‍රශ්නය

අ) පටිච්ච සමුප්පාද ධර්මයට අනුව දුක ඇතිවීමට ප්‍රධාන හේතුව කුමක්ද?

ආ) එම හේතුව පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

ඉ) පටිච්ච සමුප්පාද ධර්මයේ හේතු ප්‍රත්‍ය දොළස අනුපිළිවෙළින් දක්වන්න.

ඊ) බුද්ධ කාලීන ඉන්දියාවේ ප්‍රචලිතව පැවති ආගමික සම්ප්‍රදායයන් මඟින් ඉදිරිපත් කෙරුණු හේතුඵල වාදයන්ගෙන් පටිච්චසමුප්පාද ධර්මය වෙනස්වන ආකාරය පැහැදිළි කරන්න.

## [[ 1997 ]]

## 01 වන ප්‍රශ්නය

පටිච්ච සමුප්පද ධර්මයේ අංග දොළස අනුපිළිවෙළින් නම් කොට, එම ධර්මය පිළිබඳ පැහැදිලි විස්තරයක් කරන්න.

(අ)